සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**84 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

| | | |
|---|---|---|
| **ශිල්ප කලා** | **I, II** | *පැය තුනයි* |
| நுண்கலை | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| Arts and Crafts | **I, II** | *Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ශිල්ප කලා I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.


**1.** ශ්‍රී ලාංකේය ජනතාව හාස්‍ය උත්පාදනයට හා සෙත් ශාන්ති සඳහා යොදා ගනු ලබන ජන කලාවන් වන්නේ
(1) වෙස් මුහුණු කලාව සහ බීරලු කලාව ය.
(2) ලාක්ෂා කලාව සහ රූකඩ කලාව ය.
(3) වෙස් මුහුණු කලාව සහ රූකඩ කලාව ය.
(4) රූකඩ කලාව සහ බීරලු කලාව ය.

**2.** අඳින ලද තල ජ්‍යාමිතික රූපයක් තුළ දැක්වෙන මිනුම් සඳහන් වරණය වන්නේ
(1) දිග සහ පළල වේ.
(2) දිග සහ උස වේ.
(3) පළල සහ උස වේ.
(4) දිග, පළල සහ උස වේ.

**3.** කාර්මික ඇඳීමේ දී භාවිත වන රේඛා වර්ග සම්මත කර ඇත්තේ කුමන ආයතනය ද?
(1) ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
(2) ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය
(3) ශ්‍රී ලංකා ඉංජිනේරු සංගමය
(4) දකුණු ආසියාතික ප්‍රමිති සංවිධානය

**4.** සම්මත $A_3$ කඩදාසියක් සමමිතිකව දෙවරක් නවා නැමුම් දාර දිගේ කපා ගැනීමෙන් ලබාගත හැකි සම්මත කඩදාසි වර්ගය හා සංඛ්‍යාව වන්නේ
(1) $A_4$ කඩදාසි 4 කි.
(2) $A_5$ කඩදාසි 2 කි.
(3) $A_5$ කඩදාසි 4 කි.
(4) $A_6$ කඩදාසි 4 කි.


**5.** රූපයේ දැක්වෙන ජ්‍යාමිතික හැඩ තලයේ ඇති විශේෂ ලක්ෂණ ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.



(1) කෝණයක අගය 90° ක් වන අතර විකර්ණ සෘජුකෝණීව සමච්ඡේදනය නොවේ.
(2) සම්මුඛ පාද සමාන වන අතර ශීර්ෂ කෝණ සමච්ඡේදනය නොවේ.
(3) විකර්ණ අසමාන වන අතර පාද සමාන්තර වේ.
(4) කෝණයක අගය 90° ක් වන අතර විකර්ණ එකිනෙක සමාන වේ.

**6.** භෞතික වස්තුවක් නිර්මාණය කිරීමට පෙර එහි සැලැස්ම ඇඳීම සඳහා අවශ්‍ය වන්නේ එම වස්තුවේ
(1) රූපීය පෙනුම ය.
(2) සෘජු ප්‍රක්ෂේපණ පෙනුම ය.
(3) විකසන පෙනුම ය.
(4) ඉදිරි පෙනුම ය.

[දෙවැනි පිටුව බලන්න.

7. 


මෙම රූපයේ BC කොටස තුළ කවකටුව භාවිතයෙන් නිර්මාණය කළ හැකි කෝණවල අගයන් ඇතුළත් වරණය වන්නේ,

(1) 15°, 22°, 30°, 70° ය.
(2) 15°, 30°, 45°, 60° ය.
(3) 22°, 30°, 40°, 75° ය.
(4) 45°, 65°, 75°, 85° ය.


8. සුළු කෝණී විෂම පාද ත්‍රිකෝණයක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.
(1) එක් කෝණයක් 90° වන අතර පාද තුනම අසමාන වේ.
(2) පාද තුනම එකිනෙක අසමාන වන අතර කෝණ තුනෙහි අගයයන් ද අසමාන වේ.
(3) එක් කෝණයක් 60° වන අතර පාද සියල්ල සමාන වේ.
(4) එක් කෝණයක් 90° ට වඩා අඩුවන අතර පාද දෙකක් සමාන වේ.

9. පතුලේ අරය 2 cm ක් වූ සිලින්ඩරයක විකසන චිත්‍රය සඳහා අඳිනු ලබන සෘජුකෝණාස්‍රයේ දිග වන්නේ
(1) 4 cm කි. (2) 6 cm කි. (3) 8 cm කි. (4) 12 cm කි.

10. ඉලිප්සයක් නිර්මාණය කිරීමේ දී අනිවාර්යයෙන් ම ලබා දිය යුතු දත්ත මොනවා ද?
(1) නාභී අතර සහ නියාමන අක්ෂය අතර දුර
(2) මහා අක්ෂය සහ සුළු අක්ෂයේ දිග
(3) කුඩා වෘත්තයේ සහ මහා වෘත්තයේ අරයන්
(4) මහා අක්ෂය සහ නියාමන අක්ෂය අතර දුර

11. මොනොක්‍රෝම් වර්ණයක් සකස් කිරීමට යොදා ගත යුතු වර්ණ කාණ්ඩය අයත් වරණය තෝරන්න.
(1) ප්‍රාථමික වර්ණයක්, සුදු වර්ණය සහ කළු වර්ණය
(2) ප්‍රාථමික වර්ණයක්, ද්විතීයික වර්ණයක් සහ සුදු වර්ණය
(3) ප්‍රාථමික වර්ණයක්, තෘතීක වර්ණයක් සහ කළු වර්ණය
(4) ප්‍රාථමික වර්ණයක්, ද්විතීයික වර්ණයක් සහ තෘතීක වර්ණය

12. පහත රූපයේ දැක්වෙන චිත්‍ර සටහන වර්ණ ගැන්වීමට භාවිත කළ යුතු පින්සල් කාණ්ඩය මින් කුමක් ද?
(1) අංක 0-4 දක්වා පින්සල්
(2) අංක 2-6 දක්වා පින්සල්
(3) අංක 4-7 දක්වා පින්සල්
(4) අංක 6-8 දක්වා පින්සල්




13. රෙදිපිළි වර්ණ ගැන්වීමේ දී පෙර පිරියම්කරණයට ලක් කළ යුතු ය. සේද රෙදි වර්ණ ගැන්වීමේ දී කළ යුතු වන්නේ
(1) කාබනීකරණය සහ විරංජනයයි. (2) මැලියම්හරණය සහ විරංජනයයි.
(3) කැඳහරණය සහ මලහරණයයි. (4) මලහරණය සහ විරංජනයයි.

14. පිළිස්සීමේ පරීක්ෂණයක දී කඩදාසි පිළිස්සෙන ගඳක් සහිතව සෙමින් පිළිස්සී යන කෙන්ද වනුයේ
(1) සේද කෙන්දකි. (2) කපු කෙන්දකි.
(3) ලිනන් කෙන්දකි. (4) කෘත්‍රිම සේද කෙන්දකි.

15. රෙදි වියීමෙන් පසු රෙදිවල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා කරනු ලබන පිරියම්කරණයේ දී නිවැරදි අනුපිළිවෙළ වන්නේ
(1) මලහරණය, කැඳහරණය සහ විරංජනයයි.
(2) කැඳහරණය, මලහරණය සහ විරංජනයයි.
(3) මලහරණය, විරංජනය සහ කැඳහරණයයි.
(4) විරංජනය, කැඳහරණය සහ මලහරණයයි.


[තුන්වැනි පිටුව බලන්න.

16. පහත රූපයේ දක්වා ඇති නිර්මාණය අලංකරණය කර ඇති ශිල්පීය ක්‍රමය වන්නේ



(1) ගැටපඬු ක්‍රමයයි.
(2) බතික් ක්‍රමයයි.
(3) මුද්‍රණ ක්‍රමයයි.
(4) ස්ටෙන්සිල් ක්‍රමයයි.


17. රූපයේ දැක්වෙන මෝස්තර රටාව මුද්‍රණය කර ගැනීමට ස්වභාවික අච්චුවක් ලෙස භාවිත කළ හැකි පාරිසරික අමුද්‍රව්‍යය වන්නේ



(1) නෙළුම් අලයකි.
(2) කෙසෙල් පිත්තකි.
(3) බණ්ඩක්කා කරලකි.
(4) අර්තාපල් අලයකි.

18. තිර රාමු මුද්‍රණයේ දී රාමුවට සවිකරන ලද තිරය මත යොදන සායම් පැතිරවීම සඳහා භාවිත කරනු ලබන උපකරණය වනුයේ
(1) පින්සලයයි. (2) සායම් ඉසිනයයි. (3) සායම් පුවරුවයි. (4) ස්ක්‍යුජියයි.

19. පහත රූප සටහන්වලින් දැක්වෙන මැහුම් ක්‍රම පිළිවෙළින් සඳහන් කර ඇති වරණය තෝරන්න.




(1) දම්වැල් මැස්ම, ලේසි ඩේසි මැස්ම, හුරුළු කටු මැස්ම, බ්ලැන්කට් මැස්ම
(2) සැටින් මැස්ම, බුලියන් මැස්ම, ප්‍රංශ ගැට මැස්ම, ලේසි ඩේසි මැස්ම
(3) කතිර මැස්ම, දම්වැල් මැස්ම, සැටින් මැස්ම, නැටි මැස්ම
(4) ලේසි ඩේසි මැස්ම, දම්වැල් මැස්ම, කතිර මැස්ම, හුරුළු කටු මැස්ම

20. පේපර් ක්විලින් කලාවේ දී නිර්මාණයක් සිදු කිරීමට අනුගමනය කළ යුතු පියවර කිහිපයක් පහත දැක්වේ. ඒවායේ නිවැරදි අනුපිළිවෙළ ඇතුළත් වරණය තෝරන්න.

A - රෝල් කර ගත් පටි හැඩ ගැන්වීම
B - කඩදාසි තීරු කපා ගැනීම
C - අවශ්‍ය ප්‍රමාණවලට ලිහිල්ව සකස් කිරීම
D - කඩදාසි පටි රෝල් කර ගැනීම
E - සමතලා මතුපිටක අලවා ගැනීම

(1) A, B, C, D, E (2) B, C, D, A, E (3) B, D, A, C, E (4) C, B, A, D, E

21. පළලින් අඩු අලංකාර රටා මෝස්තර යෙදිය හැකි, විවීමේ දී හරස් නූල් සහිත නඩාව අතින් යෙදීම සිදු කරන පාපොලු සහිත අත් යන්ත්‍රය වන්නේ මින් කුමක් ද?
(1) මේස යන්ත්‍රය (2) බලවේග යන්ත්‍රය (3) ජවනඩා යන්ත්‍රය (4) චාම් යන්ත්‍රය

22. 

ඉහත රූපයේ දැක්වෙන උපකරණය භාවිත කරනු ලබන්නේ
(1) විවර තුළින් හරස් නූල් ඇදීම සඳහා ය. (2) විවර තුළින් මෝස්තර යෙදීම සඳහා ය.
(3) පුඩුවැල් තුළින් දික් නූල් ඇදීම සඳහා ය. (4) කෙඳිවලින් නූල් සකස් කිරීම සඳහා ය.

23. හැදයක් දික් දමා ගැනීම සඳහා දික් නූල් කුරුවලට නූල් ඔතා ගැනීමේ දී නූල් කැරලි රඳවා ගැනීම සිදු කරනුයේ
(1) එතුම් රෝදය මත ය. (2) මල් චක්‍රය මත ය.
(3) යන්ත්‍ර රාමුව මත ය. (4) මල් චක්‍ර කරුව මත ය.

24. නූල් අංකනය සිදු කිරීමේ දී කටින ලද නූල් මීටර් 1000 ක බර ග්‍රෑම් 40 ක් වේ නම් එහි ටෙක්ස් අංකය වන්නේ
(1) 4 කි. (2) 12 කි. (3) 20 කි. (4) 40 කි.

[හතරවැනි පිටුව බලන්න.

**25.** මෙට්‍රික් අංක $48^s$ නූල් කිලෝ ග්‍රෑම් දෙකක ඇති නූල් කැරලි සංඛ්‍යාව කොපමණ ද?
(1) 24 (2) 48 (3) 72 (4) 96


**26.** මෙට්‍රික් අංක $^{2}/_{40^s}$ නූල් කැරලි 60ක් ඇති නූල් මිටියක බර කිලෝ ග්‍රෑම්වලින් කොපමණ ද?
(1) 2 kg (2) 3 kg (3) 15 kg (4) 20 kg

**27.** දිග 100 m ක් ද පළල 30 cm ක් ද වන අත් පිස්නා හැදයක 1 cmක් තුළ දික් නූල් 50 ක් වේ නම්, එම හැදය දික් දැමීම සඳහා යොදා ගත යුතු දික් නූල් පොටවල් සංඛ්‍යාව වන්නේ
(1) 30×50 = 1500 කි. (2) 50×100 = 5000 කි.
(3) 100×30 = 3000 කි. (4) 100×30×50 = 150 000 කි.

**28.** විවීමේ අත් යන්ත්‍රවල පුඩුවැල් ක්‍රියාත්මක කිරීමට යොදා ගන්නා ලීවර යුගල් රඳවා ගනු ලබන්නේ යන්ත්‍රයේ කුමන කොටසේ ද?
(1) පොරෝදු රාමුව තුළ ය. (2) අලුව මත ය.
(3) හරස් පොලු මත ය. (4) පසු කඳ මත ය.

**29.** හැදයක් දික් දැමීමේ දී සීරු දැමීමෙන් අපේක්ෂා කරනුයේ
(1) රෙද්දේ පළල නිසි ලෙස පවත්වා ගෙන යාමට ය.
(2) වියන ලද රෙද්ද පිළිකඳට පහසුවෙන් ඔතාගැනීමට ය.
(3) පුඩුවැල් හෝ පනාවෙන් නූල් ඇදීමේ දී වෙන්කර ගැනීමේ පහසුව ය.
(4) දික් දැමීමේ දී නූල් බෙරය මත නූල් ඒකක රඳවා ගැනීමට ය.


**30.** පහත රූප සටහනේ දැක්වෙන හීරි වියමන් ප්‍රභේදය වන්නේ මින් කුමක් ද?



(1) කඩ හීරි
(2) රළ හීරි
(3) තුඩු හීරි
(4) රුවිත හීරි

**31.** මැටි වර්ගීකරණයේ දී රසායනික ජල අණු එකක් පමණක් අන්තර්ගත මැටි ප්‍රභේදය වන්නේ
(1) කෙඔලනයිට් මැටි ය. (2) මයිකා මැටි ය.
(3) මකුළු මැටි ය. (4) මොන්ට්මොරිලොනයිට් ය.

**32.** පහත රූපයේ දක්වා ඇති මැටි භාණ්ඩය සකස් කිරීම සඳහා භාවිත කරන ලද ශිල්ප ක්‍රමය වන්නේ



(1) මැටි දරණු භාවිතයයි.
(2) මැටි තහඩු භාවිතයයි.
(3) සකපෝරුවේ ඉදිකිරීමයි.
(4) නිදහස් අතින් සැකසීමයි.

**33.** භාණ්ඩ සකස් කිරීමේ දී මැටිවල ඇති සුවිකාර්යතාව ඉතා වැදගත් වේ. මේ සඳහා බලපානු ලබන්නේ මැටිවල අඩංගු
(1) ටයිටේනියම් ප්‍රතිශතයයි. (2) යකඩ ප්‍රතිශතයයි.
(3) සිලිකා ප්‍රතිශතයයි. (4) ෆෙල්ස්පාර් ප්‍රතිශතයයි.


**34.** ශ්‍රී ලංකාවේ අන්තර් කලාපීය මැටි නිධි පිහිටා ඇති ප්‍රදේශ වන්නේ
(1) කොච්චිකඩේ සහ අලුත් නුවර ය. (2) කැළණිය සහ බෙන්තොට ය.
(3) අනුරාධපුරය සහ ඔඩ්ඩුසුඩාන් ය. (4) බංගදෙණිය සහ ගල්ඔය ය.

**35.** පාන් ක්ලේ මිශ්‍රණයකින් මැටි භාණ්ඩයක් අලංකාර කිරීමේ දී එය කල්තබා ගැනීම සඳහා එක් කරනු ලබන්නේ මොනවා ද?
(1) බයින්ඩර් ගම් (2) අවර්ණ වාර්නිෂ්
(3) කපුරු කුඩු (4) වර්ණක

**36.** මැටි භාණ්ඩවලට දිස්න යොදා ඉහළ උෂ්ණත්වයට ලක් කිරීම සිදු කරන්නේ
(1) මූලික පිළිස්සීමේ දී ය. (2) නිදුලතවු පිළිස්සීමේ දී ය.
(3) බිස්කට් පිළිස්සීමේ දී ය. (4) ද්විතීයික පිළිස්සීමේ දී ය.

[පස්වැනි පිටුව බලන්න.

**37.** පහත රූපයේ දැක්වෙන පෝරණුව හඳුන්වනු ලබන්නේ



(1) උඩු දහර පෝරණුව නමිනි.
(2) යටි දහර පෝරණුව නමිනි.
(3) පැති දහර පෝරණුව නමිනි.
(4) සන්තතික පෝරණුව නමිනි.

**38.** පිට පැත්ත සඳහා මෙන් ම ඇතුල් පැත්ත සඳහා ද අච්චුවක් භාවිත කර භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ

(1) කුහර වාත්තු ක්‍රමය ලෙස ය. (2) ඝන වාත්තු ක්‍රමය ලෙස ය.
(3) සරල අච්චු ක්‍රමය ලෙස ය. (4) තනි පලුවේ අච්චු ක්‍රමය ලෙස ය.

**39.** උද්‍යාන මූර්ති නිර්මාණයේ දී හැඩතලවල පරිමාව නියමිත ප්‍රමාණවලට යොදා ගැනීම, උද්‍යාන විද්‍යා මූලධර්මවල දී හඳුන්වන්නේ

(1) සම්පිණ්ඩනය යනුවෙනි. (2) සමබරතාව යනුවෙනි.
(3) අනුපාතය යනුවෙනි. (4) විවිධත්වය යනුවෙනි.

**40.** සකස් කරගත් උද්‍යාන මූර්තියක හෝ බිතු කැටයමක වර්ණ ආරක්ෂාවීම සඳහා භාවිත කළ හැකි ආලේපනයක් වන්නේ

(1) ලැකර් ය. (2) එනැමල් ය.
(3) ඉමල්ෂන් ය. (4) වාර්නිෂ් ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**84 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**ශිල්ප කලා I, II**
நுண்கலை I, II
Arts and Crafts I, II

## ශිල්ප කලා II

✳ **පළමුවැනි** ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** ලෝක ගුරු දිනය සමරමින් පාසලේ සිසුන් සංවිධානය කිරීමට නියමිත ගුරු උපහාර දිනය සඳහා පාසලේ ශිෂ්‍ය නායකයින් විසින් උත්සවයක් සැලසුම් කිරීමට කටයුතු කරන ලදී.

(i) ගුරු උපහාර උත්සවය පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ii) ගුරු භවතුන් පිළිගැනීමට සුදුසු මල් සැකසුමක් චිත්‍රණය කරන්න.

(iii) ගුරුවරුන් පිළිගැනීමේ දී සාරියේ හෝ කමිසයේ පැළඳවීමට යෝග්‍ය නිර්මාණශීලී පැළඳුමක් ඇඳ දක්වන්න.

(iv) උත්සව අවස්ථාවේ දැල්වීමට ස්වභාවික අමුද්‍රව්‍ය ඇසුරින් සකස් කළ පහනක් සඳහා භාවිත කළ හැකි අමුද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.

(v) වේදිකාවේ පසු තිරයේ 'ගුරු උපහාර' යන්න මුද්‍රණය කිරීමට භාවිත කළ හැකි මුද්‍රණ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(vi) සංවිධායක කමිටුවේ සාමාජිකයින් හඳුනා ගැනීම සඳහා අතේ පැළඳිය හැකි විසිතුරු පටියක් සකස් කර ගැනීම සඳහා භාවිත කළ හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කරන්න.

(vii) ආරාධිත අමුත්තන්ගේ ආසන අලංකාර කිරීමට පැච්වර්ක් ක්‍රමයෙන් සකසන ලද පුටු ආවරණයක් සඳහා මෝස්තරයක් ඇඳ දක්වන්න.

(viii) ගුරුවරුන් සඳහා තිළිණයක් ලෙස ලබාදීමට එකම ආකාරයේ මැටි නිර්මාණයක් සකස් කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කරන්න.

(ix) උපහාර පිදීමේ දී ලබා දීමට අපේක්ෂිත තිළිණය මත, එය ලබා ගන්නා ගුරුභවතාගේ ඡායාරූපය ඇතුළත් කිරීමට යොදා ගත හැකි මැටි භාණ්ඩ අලංකරණ ක්‍රම ශිල්පය සඳහන් කරන්න.

(x) තිළිණය ඇසිරීම සඳහා යෝග්‍ය ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.

**2.** ඕනෑම කාර්යයක් සාර්ථකවීම සඳහා මනා සැලසුමක් අවශ්‍ය වේ. භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ දී සැලසුම් චිත්‍ර නිර්මාණය අත්‍යවශ්‍ය සාධකයක් වේ.

(i) කෝදුව හා කවකටුව පමණක් භාවිත කර 45° හා 120° කෝණ නිර්මාණය කර දක්වන්න.

(ii) මහා අක්ෂය 8 cm, සුළු අක්ෂය 5 cm වූ ඉලිප්සයක් ඔබ කැමති ක්‍රම ශිල්පයකින් නිර්මාණය කර දක්වන්න.

(iii) ත්‍රිකෝණාකාර ප්‍රිස්මයක හැඩැති තේ කොළ ඇසුරුමක පියන් සහිත විකසන චිත්‍රය ඇඳ දක්වන්න. පහත තොරතුරු ඊට අදාළ කර ගන්න.

දිග - 10 cm
පළල - 4 cm

**3.** අතීතයේ සිට ගෘහණියන් තම ගෘහ අලංකරණය සඳහා විවිධ වූ ක්‍රම ශිල්ප භාවිත කරනු ලබයි.

(i) කෘත්‍රිම මල් සැකසුම් නිර්මාණය සඳහා යොදා ගත හැකි මාධ්‍ය **දෙකක්** ලියන්න.

(ii) රිබන් භාවිත කර නිර්මාණ මසා ගැනීමේ දී භාවිත කළ හැකි රිබන් වර්ග **හතරක්** සඳහන් කර, බිත්ති සැරසිල්ලකට සුදුසු නිර්මාණයක් චිත්‍රණය කරන්න.

(iii) කුඩා දරුවකුට ගැළපෙන රෙදි බෝනික්කකු මසා ගැනීමේ ක්‍රියාවලිය පියවර අනුව රූප සටහන් භාවිතයෙන් විස්තර කර දක්වන්න.

**4.** කාන්තා විසිතුරු අත් බෑග් නිර්මාණය සඳහා පළලින් අඩු රෙද්දක් වියා ගැනීමට පහත සඳහන් ප්‍රමාණයන් අනුව හැදයක් දික් දමා ගත යුතු ය.

- ✳ හැදයේ දිග 50 m කි.
- ✳ හැදයේ පළල 40 cm කි.
- ✳ 1 cm කට යොදන දික් නූල් ගණන 40 කි.
- ✳ දික් නූලේ අංකය $2/80^{s}$ ක් වේ.

(i) හැදය විවීම සඳහා භාවිත කළ හැකි චාම් වියමන් ප්‍රභේද **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඉහත (i) හි සඳහන් කළ වියමන් රටාවන් **දෙක** ප්‍රස්තාරගත කරන්න.

(iii) හැදය දික් දැමීමට අවශ්‍ය දික් නූල් ප්‍රමාණයේ බර ගණනය කරන්න.

**5.** රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේ දී යන්ත්‍ර සූත්‍ර මෙන් ම විවිධ ක්‍රම ශිල්ප භාවිතයට ගැනේ.

(i) දික් නූල් ඔතා ගැනීම සඳහා භාවිත කරන නූල් කූරක රූප සටහනක් දක්වන්න.

(ii) නූල් දික් ගැසීම සඳහා භාවිත කරන උපකරණ කට්ටලය නම් කර, ඒවායේ කාර්යන් ලියා දක්වන්න.

(iii) රෙදිවලින් සැකසූ අත් බෑගයකට සුදුසු මෝස්තරයක් ස්ටෙන්සිල් ක්‍රමයෙන් අලංකාර කර ගන්නා ආකාරය චිත්‍ර සටහන් සමග විස්තර කරන්න.

**6.** අතීතයේ සිට වර්තමානය දක්වා ම සෙරමික් කලාව විවිධ විපර්යාසයන්ට ලක්වෙමින් විකාශනය වී ඇත.

(i) තාක්ෂණික උපකරණ භාවිත කරමින් මැටි භාණ්ඩ සකස් කළ හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඔබ කැමති මැටි භාණ්ඩ නිර්මාණ ක්‍රම ශිල්පයක් භාවිතයෙන් මැටි භාණ්ඩයක් සකස් කර ගන්නා ආකාරය පියවර සහිතව විස්තර කරන්න.

(iii) නිෂ්පාදිත මැටි භාණ්ඩයක් පිළිස්සීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

**7.** ගෘහ නිර්මාණ ශිල්පයේ දී ගෘහ අලංකරණය මෙන් ම උද්‍යාන අලංකරණ නිර්මාණ සඳහා ද විශේෂ වැදගත්කමක් හිමි වේ.

(i) උද්‍යාන අලංකරණ මූර්ති සඳහා භාවිත කළ හැකි මාධ්‍ය **හතරක්** සඳහන් කරන්න.

(ii) ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා විශාල මැටි බඳුනක් නිෂ්පාදන අවස්ථාවේ දී අලංකරණය කිරීමට යොදා ගත හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කර, ඉන් **එක්** ක්‍රම ශිල්පයක් විස්තර කරන්න.

(iii) උද්‍යානයක තැබීමට සුදුසු සත්ත්ව ආකෘතියක් යෝග්‍ය මාධ්‍යයක් භාවිතයෙන් නිර්මාණය කරන ආකාරය පියවර සහිතව පැහැදිලි කරන්න.

✳ ✳ ✳

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025)

# 84 - ශිල්ප කලා

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

## 84 - ශිල්ප කලා

### ලකුණු දීමේ පටිපාටිය

ලකුණු බෙදී යාම

I පත්‍රය = 40

II පත්‍රය = 20 + (10 X 4) = 60

මුළු ලකුණු 40 + 60 = 100

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................
............................................ √ △ 4/5
............................................

(ii) ............................................
............................................ √ △ 3/5
............................................

(iii) ............................................
............................................ √ △ 3/5
............................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

## 84 - ශිල්ප කලා

## ලකුණු දීමේ පටිපාටිය

**එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාම පිළිබඳ සාරාංශය**

**I පත්‍රය :** මෙය බහුවරණ ප්‍රශ්න හතළිහකින් යුක්තය. එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් ප්‍රදානය කෙරේ. මුළු ලකුණු ප්‍රමාණය 40 කි.

**II පත්‍රය :** ප්‍රශ්න හතරකින් යුක්තය. ප්‍රශ්න අංක එක අනිවාර්ය වේ. එහි ඇති කොටස් දහය සඳහාම පිළිතුරු දීම අපේක්ෂිතය. එක් නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු විස්සකි. මෙම ප්‍රශ්නය සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය වන ආකාරයට සැකසී ඇත.

ඉතිරි ප්‍රශ්න 06 අතරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එක් පිළිතුරකට ලකුණු 10 ක් ප්‍රදානය කෙරේ. සෑම ප්‍රශ්නයක්ම කොටස් 03 කින් යුක්ත වන අතර කොටස් තුනට බර තබා ඇත්තේ ක්‍රමයෙන් ගැඹුරු වන ආකාරයට වේ. තෝරාගත් ප්‍රශ්න හතර සඳහා හිමිවන ලකුණු ප්‍රමාණය (10 x 4) හතළිහකි. මේ අනුව II පත්‍රය සඳහා මුළු ලකුණු ප්‍රමාණය 20 + (10 x 4) = 60 කි.

(II ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු සැපයීමේ දී පළමු ප්‍රශ්නය හා තෝරාගත් ප්‍රශ්න 04 සමග ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.)

සම්පූර්ණ ප්‍රශ්න පත්‍රය සඳහා
I පත්‍රය = 40
II පත්‍රය = 20 + (10 x 4) = 60
මුළු ලකුණු 40 + 60 = 100 කි

## අවසාන ලකුණු ගණනය කිරීම සඳහා උපදෙස්

- ලකුණු ප්‍රදානය කිරීමේදී එක් එක් පිළිතුරු කොටස් සඳහා දකුණු පස තීරුවේ ලකුණු සටහන් කරන්න.
- සෑම ප්‍රශ්නයකම අවසානයේ පහතින් ලකුණු සටහන් කළ යුත්තේ ප්‍රශ්න අංකය ලියා ඒ ඉදිරියෙන් භාග සංඛ්‍යා සහිතව තිරස්ව සඳහන් කිරීමෙනි.
- දකුණු පස තීරුවේ යොදන ලකුණු සංඛ්‍යාව සහ භාග සංඛ්‍යා ලෙස තිරස්ව ලියන ලද ලකුණු සංඛ්‍යාව සමාන විය යුතු අතර සිරස් ලකුණු එකතුව සහ තිරස් ලකුණු එකතුව සමාන වීම අත්‍යවශ්‍ය බව සලකන්න.
- පළමු පිටුවට ලකුණු ගෙන ඒමේ දී ඇතුළු පිටුවල ලබා දී ඇති ලකුණු නිවැරදිව ඉදිරියට ගෙන ඇති දැයි සමාන කර බලන්න. ඒ පිළිබඳ ඔබේ අවධානය දැඩි ලෙස යොමු කරන්න.
- අවසාන ලකුණු ගණනය කිරීමේ දී ඔබේ ගණිත පරීක්ෂකගේ සහය හොඳින් ලබා ගෙන ලකුණුවල නිරවද්‍යතාව ආරක්ෂා කර ගන්න.

## ලකුණු ලැයිස්තු පිළියෙල කිරීම සඳහා උපදෙස්

- ලකුණු ලැයිස්තුවේ සඳහන් අයදුම්කරුගේ විභාග අංකය සමග උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හොඳින් සසඳා බලන්න. වෙනසක් දක්නට තිබේනම් ප්‍රධාන පරීක්ෂක වෙත වාර්තා කරන්න.
- පිළිතුරුපතට හිමි ලකුණු විස්තර ලකුණු ලැයිස්තුවට ගැනීමේ දී ප්‍රශ්න අංකයට නිවැරදිව ඇතුලත්කිරීම පිළිබඳ අවධානය යොදන්න.
- පැහැදිලි ලෙස ඉලක්කම් ලියන්න. ඉලක්කම් ලිවීමේ දී ලබා දී ඇති උපදෙස් පිළිපදින්න.
- වැරදීමක් සිදු වූ විට නැවත ඒ මත නොලියා එය තනි ඉරකින් කපා හැර ඒ ආසන්නයේම නැවත පැහැදිලිව ලියන්න. කෙටි අත්සන ද යොදන්න.

## I පත්‍රයේ අභිමතාර්ථ පිළිබඳ හැඳින්වීමක්

ශිල්ප කලා විෂයයේ I ප්‍රශ්න පත්‍රය ගොනුකර ඇත්තේ සමස්ථ විෂය ක්ෂේත්‍රයම ආවරණය කෙරෙමිනි. බහුවරණ ප්‍රශ්න 40 තුළින් සිසු දරුවන්ගේ න්‍යායික දැනුම පමණක් නොව ආකල්ප සහ කුසලතා පිළිබඳ ව ඇගයීම අපේක්ෂා කෙරේ.

කාර්මික ඇඳීම විෂය ක්ෂේත්‍රයේ එයට අදාල න්‍යායික දැනුම උපයෝගී කර ගනිමින් කෙරෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඇගයීම සඳහා හොඳින් සංවිධානය කරන ලද ප්‍රශ්න සමූහය මගින් සිසුන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතාවන්ට අමතරව නිපුණතා පිළිබඳව අධීක්ෂණය කෙරේ. රෙදිපිළි අලංකරණ ක්‍රම, සම්ප්‍රදායික වියමන් රටා, විවීමේ මූලධර්ම, උත්සව අවස්ථා සඳහා නිර්මාණ, මැටි මාධ්‍ය නිර්මාණ, මැටි භාණ්ඩ අලංකරණය සහ උද්‍යාන අලංකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව සිසුන්ගේ දැනුම් ආශ්‍රිත න්‍යායික අභ්‍යාස ආවේදන ආශ්‍රිතව ගොඩනැගෙන සංකල්පමය හැකියා සමග ක්‍රියාකාරකම් තුළින් මතුකෙරෙන කුසලතා පිළිබඳවත්, මේ සියල්ල තුළින් මතුවන නිපුනතා වන පිළිබඳ සමස්ත ඇගයීම I පත්‍රයේ අභිමතාර්ථ ලෙස දැක්විය හැකිය.

## I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

- **බහුවරණ පිළිතුරු පත්‍ර ලකුණු කිරීම සඳහා භාවිත කරන "කවුළු පත" සකස් කිරීමේ දී පහත සඳහන් උපදෙස් පිළි පදින්න.**
    - ප්‍රශ්න අංක සටහන්කර ඇති තීරු, අංක පෙනෙන ලෙස සිරස් අතට කපා ඉවත් කරන්න.
    - අවසාන අංක දහය දක්වා ඇති (අංක 30 - 40) තීරුවේ දකුණු කෙළවර හිස් කොටස සිරස් අතට කපා එම තීරුව හරි වැරදි ලකුණු යෙදීමට ඉඩ ගන්න.
    - නිවැරදි පිළිතුරු ඇතුලත් අංක කපා ඉවත් කර, කවුළු නිවැරදිව සකසා ගන්න.
    - වරණ එකකට වඩා පිළිතුරු වශයෙන් ලකුණුකර තිබේ නම් තනි ඉරකින් තිරස්ව කපා හරින්න.
    - කිසිවක් ලකුණු කර නොමැති වරණ පේළි තිබේ නම් ඒවා ද තිරස් අතට තනි ඉරකින් කපන්න.
- **උත්තර පත්‍ර මත කවුළු පත නිවැරදිව අංක සිටින සේ තබා ගැනීමට සැලකිලිමත් වන්න.**
    - සෑම නිවැරදි පිළිතුරකටම (✓) හරි ලකුණක් යොදන්න. මේ සඳහා රතු පැහැති පෑනක් භාවිතා කරන්න.
    - සෑම වැරදි පිළිතුරකටම (×) වැරදි ලකුණක් යෙදීමට මතක තබා ගන්න.
    - ප්‍රශ්න අංකයට දකුණු පසින් එම සලකුණු යෙදීම ඉතා වැදගත්ය.
    - එක් එක් පේළියේ පහළ කෙළවරින් නිවැරදි පිළිතුරු සංඛ්‍යාව සටහන් කරන්න.
- **නිවැරදි පිළිතුරු සංඛ්‍යාව එනම් මුළු එකතුව නියමිත කොටුව තුළ පැහැදිලි ඉලක්කම්වලින් සටහන් කරන්න.**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

## 84 - ශිල්ප කලා -

### ලකුණු දීමේ පටිපාටිය

**ප්‍රශ්න අංක 01**

| | | |
|---|---|---|
| I | ලකුණු - | 02 |
| II | ලකුණු - | 02 |
| III | ලකුණු - | 02 |
| IV | ලකුණු - | 02 |
| V | ලකුණු - | 02 |
| VI | ලකුණු - | 02 |
| VII | ලකුණු - | 02 |
| VIII | ලකුණු - | 02 |
| IX | ලකුණු - | 02 |
| X | ලකුණු - | 02 |
| | මුළු ලකුණු | 20 |

**ප්‍රශ්න අංක 02**

| | | |
|---|---|---|
| I | ලකුණු - | 02 |
| II | ලකුණු - | 04 |
| III | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 03**

| | | |
|---|---|---|
| I | ලකුණු - | 02 |
| II | ලකුණු - | 04 |
| III | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 04**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 04 |
| III කොටස | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 05**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 03 |
| III කොටස | ලකුණු - | 05 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 06**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 04 |
| III කොටස | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 07**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 04 |
| III කොටස | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்
## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2024(2025)
## க.பொ.த (சா.தர)ப் பரீட்சை – 2024(2025)

| විෂයය අංකය<br>பாட இலக்கம் | 84 | විෂයය<br>பாடம் | ශිල්පකලා |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 03 | 11. | 01 | 21. | 04 | 31. | 04 |
| 02. | 01 | 12. | 01 | 22. | 03 | 32. | 02 |
| 03. | 02 | 13. | 02 | 23. | 02 | 33. | 02 |
| 04. | 03 | 14. | 02, 03 | 24. | 01 | 34. | 01 |
| 05. | 04 | 15. | 02 | 25. | 04 | 35. | 03 |
| 06. | 01 | 16. | 01 | 26. | 02 | 36. | 04 |
| 07. | 02 | 17. | 02 | 27. | 01 | 37. | 01 |
| 08. | 02 | 18. | 04 | 28. | 01 | 38. | 02 |
| 09. | 04 | 19. | 01 | 29. | 03 | 39. | 03 |
| 10. | 02 | 20. | 03 | 30. | 01 | 40. | 04 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |

## II පත්‍රයේ අභිමතාර්ථ පිළිබඳ හැඳින්වීමක්

සමස්ත විෂය නිර්දේශයම ආවරණය කෙරෙමින් ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. කුසලතා මූලික කොටගත් ක්‍රියාකාරකම් තුළින් පූර්ණ පද්ගලයකු බිහි කරවීමේ සංකල්පය ක්‍රියාත්මක කෙරෙන අතර දැනුම පාදක කෙරෙමින් ඇති කරන ආකල්ප සහ කුසලතා වර්ධනය තුළින් නිපුණතා වෙතට ගමන් කරන සිසුවාගේ ප්‍රාගුණ්‍යය කන්සේරු කරමින් ඇගයීමට ලක්කිරීම, ප්‍රමුඛතම අභිමතාර්ථය වෙයි.

ජ්‍යාමිතික ඇඳීම විෂය ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායික දැනුම සමග නිර්මාණාත්මක ක්‍රියාකාරකම් තුළින් ගොඩනැගෙන නිපුණතා හඳුනාගැනීමේ අපේක්ෂාවෙන් II පත්‍රයේ ප්‍රශ්න රාශියක් ඉදිරිපත්කර ඇති ශ්‍රී ලංකාවේ ජනකලා රෙදිපිළි අලංකරණ ක්‍රම, වියමන් ආශ්‍රිත ක්‍රියාකාරකම්, ගෙතීමේ කුසලතා, විවීම පිළිබඳ මූලික සිද්ධාන්ත පදනම් කරගත් කණ්ඩායම්, ක්‍රියාකාරකම් මැටි මාධ්‍යයෙන් සිදුකෙරෙන නිර්මාණ, මැටි බඳුන් අලංකරණ විධි ක්‍රම සහ සිමෙන්ති මාධ්‍යය උපයෝගී කෙරෙමින් සිදුකෙරෙන නිර්මාණ ඇතුලත් විෂය ක්ෂේත්‍රයන් හරහා සිසුන් ලබාගන්නා හැකියා නොහැකියා ඇගයීමත් ඔවුන්ගේ නිර්මාණශීලී චින්තනය අවධි කරවන සුළු න්‍යායික හා ප්‍රායෝගික කුසලතා සහ ඒ තුළින් ගොඩ නැගෙන නිපුණතා පැහැදිලිව හඳුනා ගැනීමේ අවස්ථාව උදාකර ගැනීම සුවිශේෂී අභිමතාර්ථයයි.

## II පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

- ලකුණු දීමේ පටිපාටිය හොඳින් කියවා තහවුරු කරගන්න.
- උත්තර පත්‍ර ලකුණු කිරීම සඳහා රතු තීන්ත යොදන ලද පෑනක් (බෝල් පොයින්ට්) භාවිත කරන්න.
- පිළිතුරුපත් කියවීමේ දී සෑම පිළිතුරකම නිවැරදි කරුණු ඉදිරිපත්කර ඇති ස්ථානයක දී එම ස්ථානයේ (✓) හරි ලකුණක් යොදන්න. වැරදි පිළිතුරු සඳහා වැරදි (×) ලකුණු යොදා එම පිළිතුර වැරදි බව පෙන්වන්න.
- ප්‍රශ්න පත්‍රයේ උපදෙස් දී ඇති පරිදි ඒ ඒ කොටස් වලින් නියමිත පරිදි, ප්‍රශ්න තෝරාගෙන ඇත්දැයි විමසිලිමත් වන්න.
- අනිවාර්ය ප්‍රශ්නය වූ පළමුවැනි ප්‍රශ්නයත්, තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයා තිබේදැයි සැළකිල්ලෙන් බලන්න.
- ඒ ඒ ප්‍රශ්නයේ කොටස්වලට හිමිවිය යුතු ලකුණු නිවැරදිව ලබා දී දකුණු පැත්තේ සටහන් කිරීමට සහ නිවැරැදිව ලකුණු එකතු කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොදන්න.

# අ.පො.ස(සා.පෙළ) විභාගය 2024(2025)

## 84 ශිල්ප කලා II

**II පත්‍රයේ I වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය තුළින් ශිල්ප කලා විෂය ධාරාවට අයත් සියලු නිපුණතාවයන්හි න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාවලීන් ඇගයීමට ලක්වන සේ ප්‍රශ්න කොටස් ඉදිරිපත් කරනු ලැබේ.**

**1.** ලෝක ගුරු දිනය සමරමින් පාසලේ සිසුන් සංවිධානය කිරීමට නියමිත ගුරු උපහාර දිනය සඳහා පාසලේ ශිෂ්‍ය නායකයින් විසින් උත්සවයක් සැලසුම් කිරීමට කටයුතු කරන ලදී.

(i) ගුරු උපහාර උත්සවය පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ii) ගුරු භවතුන් පිළිගැනීමට සුදුසු මල් සැකසුමක් චිත්‍රණය කරන්න.

(iii) ගුරුවරුන් පිළිගැනීමේ දී සාරියේ හෝ කමිසයේ පැළඳවීමට යෝග්‍ය නිර්මාණශීලි පැළඳුමක් ඇඳ දක්වන්න.

(iv) උත්සව අවස්ථාවේ දැල්වීමට ස්වභාවික අමුද්‍රව්‍ය ඇසුරින් සකස් කළ පහනක් සඳහා භාවිත කළ හැකි අමුද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.

(v) වේදිකාවේ පසු තිරයේ 'ගුරු උපහාර' යන්න මුද්‍රණය කිරීමට භාවිත කළ හැකි මුද්‍රණ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(vi) සංවිධායක කමිටුවේ සාමාජිකයින් හඳුනා ගැනීම සඳහා අතේ පැළඳිය හැකි විසිතුරු පටියක් සකස් කර ගැනීම සඳහා භාවිත කළ හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කරන්න.

(vii) ආරාධිත අමුත්තන්ගේ ආසන අලංකාර කිරීමට පැච්වර්ක් ක්‍රමයෙන් සකසන ලද පුටු ආවරණයක් සඳහා මෝස්තරයක් ඇඳ දක්වන්න.

(viii) ගුරුවරුන් සඳහා තිළිණයක් ලෙස ලබාදීමට එකම ආකාරයේ මැටි නිර්මාණයක් සකස් කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කරන්න.

(ix) උපහාර පිදීමේ දී ලබා දීමට අපේක්ෂිත තිළිණය මත, එය ලබා ගන්නා ගුරුභවතාගේ ඡායාරූපය ඇතුළත් කිරීමට යොදා ගත හැකි මැටි භාණ්ඩ අලංකරණ ක්‍රම ශිල්පය සඳහන් කරන්න.

(x) තිළිණය ඇසිරීම සඳහා යෝග්‍ය ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.

(i) තේමාවට ගැලපෙන පෝස්ටරයක්, දිනය,වේලාව,ස්ථානය සඳහන් කර ඇඳ තිබීම.

**(ලකුණු 02)**

(ii) පිළිගැනීමේ කාර්යයට ගැළපෙන මල් සැකසුමක චිත්‍රයක් ඇඳ තිබීම

**(ලකුණු 02)**

(iii) පැළඳීම සඳහා ගැලපෙන තේමාව මූලික කරගත් නිර්මාණයක සැලසුම් චිත්‍රය් ඇඳීමට

**(ලකුණු 02)**

(iv) ස්වභාවික ශාක කොටස්, වැලි, පාෂාණ වැනි ස්වභාවික සම්පත් දෙකක් නම් කිරීම.

**(ලකුණු 02)**

(v) ස්ටෙන්සිල්, පින්තාරු කිරීම, අච්චු මුද්‍රණය, සේද රාමු මුද්‍රණය, ඩිජිටල් මුද්‍රණය වැනි ඕනෑම මුද්‍රණ ක්‍රම දෙකක් ලිවීම

**(ලකුණු 02)**

(vi) ගෙතීම, ටැබ්ලට් විවීම

(ලකුණු 02)

(vii) පුටු ආවරණයකට සුදුසු මෝස්තර රටාවක් ඇඳීම

(ලකුණු 02)

(viii) අච්චු ක්‍රමය, වාත්තු ක්‍රමය

(ලකුණු 02)

(ix) ඩෙකොපර් ක්‍රමය, ඩිජිටල් ක්‍රමය

(ලකුණු 02)

(x) තිළිණය බහාලීමට හැකි ඇසුරුමක චිත්‍රයක් ඇඳීම


(ලකුණු 02)

(මුළු ලකුණු 20)


2. **මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමෙන් අපේක්ෂා කරනුයේ ශිල්ප කලා විෂයේ දී සිදු කරනු ලබන නිර්මාණයන් සඳහා භාවිත කරනු ලබන ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීමේ මූලධර්මයන් ප්‍රායෝගිකව හා න්‍යායාත්මකව භාවිත කිරීමේ හැකියාව ඇගයීමට ලක් කිරීමයි.**

| |
|---|
| **2.** ඕනෑම කාර්යයක් සාර්ථකවීම සඳහා මනා සැලසුමක් අවශ්‍ය වේ. භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ දී සැලසුම් චිත්‍ර නිර්මාණය අත්‍යවශ්‍ය සාධකයක් වේ.<br>(i) කෝදුව හා කවකටුව පමණක් භාවිත කර 45° හා 120° කෝණ නිර්මාණය කර දක්වන්න.<br>(ii) මහා අක්ෂය 8 cm, සුළු අක්ෂය 5 cm වූ ඉලිප්සයක් ඔබ කැමති ක්‍රම ශිල්පයකින් නිර්මාණය කර දක්වන්න.<br>(iii) ත්‍රිකෝණාකාර ප්‍රිස්මයක හැඩැති තේ කොළ ඇසුරුමක පියන් සහිත විකසන චිත්‍රය ඇඳ දක්වන්න. පහත තොරතුරු ඊට අදාළ කර ගන්න.<br>දිග - 10 cm<br>පළල - 4 cm |

(i)




වෙනත් ක්‍රම භාවිත කර නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.





කෝණ දෙක නිර්මාණය කිරීම
(ලකුණු 02)

(ii) ඉලිප්සය ඇඳීමේ දී

- ➢ චාප ක්‍රමය
- ➢ ඒක කේන්ද්‍රික වෘත්ත ක්‍රමය
- ➢ සෘජුකෝණාස්‍ර ක්‍රමය

යන තෝරාගත් ක්‍රම ශිල්පයක් භාවිතයෙන් මහා අක්ෂය 8 cm සුළු අක්ෂය 5 cm වූ ඉලිප්සය නිර්මාණය කිරීම.


<u>චාප ක්‍රමය</u>





| | |
|---|---|
| මහා අක්ෂය ඇඳීම | **(ලකුණු** 01) |
| සුළු අක්ෂය ඇඳීම | **(ලකුණු** 01) |
| ලක්ෂය ලකුණු දීම | **(ලකුණු** 01) |
| ඉලිප්සය නිර්මාණයට | **(ලකුණු** 01) |
| | *(මුළු ලකුණු 04)* |

**හෝ**

<u>ඒක කේන්ද්‍රික වෘත්ත ක්‍රමය</u>



(iii) දිග 10 cm ද පළල 4 cm නිවැරදිව දක්වන ලද ත්‍රිකෝණාකාර ප්‍රිස්මයක හැඩති තේ කොළ ඇසුරුමේ විකසනය ඇඳීම.



3. අභිමතාර්ථ

**ගෘහ අභ්‍යන්තර අලංකරණයේදී යොදා ගන්නා කෘත්‍රිම මල් සැකසුම් නිර්මාණය කිරීම, භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී යොදාගන්නා විසිතුරු මැහුම් ක්‍රම හා නිවැරදි ක්‍රම ශිල්ප භාවිත කරමින් පතරොමක් සකස් කර රෙදිබෝනික්කෙකු සැකසීම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම මැන බැලීම මින් අපේක්ෂා කෙරේ.**

| |
|---|
| **3.** අතීතයේ සිට ගෘහණියන් තම ගෘහ අලංකරණය සඳහා විවිධ වූ ක්‍රම ශිල්ප භාවිත කරනු ලබයි. |
| **(i)** කෘත්‍රිම මල් සැකසුම් නිර්මාණය සඳහා යොදා ගත හැකි මාධ්‍ය **දෙකක්** ලියන්න. |
| **(ii)** රිබන් භාවිත කර නිර්මාණ මසා ගැනීමේ දී භාවිත කළ හැකි රිබන් වර්ග **හතරක්** සඳහන් කර, බිත්ති සැරසිල්ලකට සුදුසු නිර්මාණයක් චිත්‍රණය කරන්න. |
| **(iii)** කුඩා දරුවකුට ගැළපෙන රෙදි බෝනික්කකු මසා ගැනීමේ ක්‍රියාවලිය පියවර අනුව රූප සටහන් භාවිතයෙන් විස්තර කර දක්වන්න. |

(i) කඩදාසි
පබළු
වියලි ශාක කොටස්
රෙදි වර්ග
පුළුන්
කම්බි
ගම්ටේප්
පොලිතීන් කඩදාසි
රිබන්

**මින් දෙකක් නම් කර තිබීමට**

**(ලකුණු 02)**

(ii)

❖ බේබි රිබන්
සැටින් රිබන්
ඕගන්ඩි රිබන්
ෂේඩඩ් රිබන්

**(ලකුණු 02)**

❖ නිර්මාණ චිත්‍ර ඇඳීමට

**(ලකුණු 02)**

(iii) රෙදි බෝනික්කා මැසීමට රෙදි තෝරා ගැනීමේ සිට නිමි භාණ්ඩය තෙක් සිදු කරන ක්‍රියාවලිය රූප සටහන් සහිතව විස්තර කිරීමට

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

4. මෙම ප්‍රශ්නය මගින් රෙදිපිළි නිෂ්පාදනයේදී යොදාගන්නා වියමන් රටා හඳුනා ගැනීම,රෙදිපිළි නිෂ්පාදනයේ දී පිරිවැය ගණනය කිරීම,වියමන් රටා ප්‍රස්තාරගත කිරීම පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම, ආකල්ප හා කුසලතා ඇගයීම අපේක්ෂා කෙරේ.

> 4. කාන්තා විසිතුරු අත් බෑග් නිර්මාණය සඳහා පළලින් අඩු රෙද්දක් වියා ගැනීමට පහත සඳහන් ප්‍රමාණයන් අනුව හැදයක් දික් දමා ගත යුතු ය.
>
> ❋ හැදයේ දිග 50 m කි.
>
> ❋ හැදයේ පළල 40 cm කි.
>
> ❋ 1 cm කට යොදන දික් නූල් ගණන 40 කි.
>
> ❋ දික් නූලේ අංකය $2/80^s$ ක් වේ.
>
> (i) හැදය විවීම සඳහා භාවිත කළ හැකි චාම් වියමන් ප්‍රභේද **දෙකක්** සඳහන් කරන්න.
>
> (ii) ඉහත (i) හි සඳහන් කළ වියමන් රටාවන් **දෙක** ප්‍රස්තාරගත කරන්න.
>
> (iii) හැදය දික් දැමීමට අවශ්‍ය දික් නූල් ප්‍රමාණයේ බර ගණනය කරන්න.

(i) චාම් වියමන

ජටා වියමන

දික් දාර වියමන

හරස් දාර වියමන

රටා දෙකක් නම් කිරීමට
(ලකුණු 02)

(ii) ඉහත සඳහන් කළ වියමන් රටා දෙක නිවැරදිව ප්‍රස්තාර ගත කිරීම
(ලකුණු 02)

(iii) කිලෝ ග්‍රෑම් වලින්

$$\frac{50 \times 40 \times 40 \times 2}{1000 \times 80} = 2 \text{ kg}$$

නිවැරදිව සූත්‍රය පිහිටුවීමට (ලකුණු 02)


පිළිතුර නිවැරදිව ලබා ගැනීමට (ලකුණු 02)

(මුළු ලකුණු 10)

5. **මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම තුළින් අපේක්ෂා කෙරෙනුයේ රෙදි කර්මාන්තයේදී රෙදි වියමේ කාර්යට භාවිත කරන උපකරණ කට්ටලයේ කාර්යන් හා පහසුවෙන් රෙදි පිළි අලංකරණ පිළිබඳවය.**

> **5.** රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේ දී යන්ත්‍ර සූත්‍ර මෙන් ම විවිධ ක්‍රම ශිල්ප භාවිතයට ගැනේ.
> (i) දික් නූල් ඔතා ගැනීම සඳහා භාවිත කරන නූල් කුරක රූප සටහනක් දක්වන්න.
> (ii) නූල් දික් ගැසීම සඳහා භාවිත කරන උපකරණ කට්ටලය නම් කර, ඒවායේ කාර්යන් ලියා දක්වන්න.
> (iii) රෙදිවලින් සැකසූ අත් බෑගයකට සුදුසු මෝස්තරයක් ස්ටෙන්සිල් ක්‍රමයෙන් අලංකාර කර ගන්නා ආකාරය චිත්‍ර සටහන් සමග විස්තර කරන්න.

(i)



රූප සටහන ඇඳීමට
(ලකුණු 02)

(ii)

- දික් නූල් කුරු - දික් නූල් එතීමට
- දික් නූල් කුරු රාක්කය - ඔතා ගත් දික් නූල් කුරු අසුරා ගැනීමට
- නූල් බෙත්ම - සීරු දැමීමට, දික් නූල් අවුල් වීම වලකා ගැනීමට
- නූල් බෙරය - නූල් ඒකක නියමිත දිග හා පළල පවත්වා ගෙන හැදය පවත්වා ගැනීම හා නූල් කඳට නූල් ඔතා ගැනීමටය

(ලකුණු 04)

(iii) ස්ටෙන්සිල් ක්‍රමය මුද්‍රණය කළ හැකි අත් බෑගයකට සුදුසු මෝස්තරයක් ඇඳ විස්තර කිරීමට

(ලකුණු 04)

**මුළු ලකුණු 10**

6. **සෙරමික් භාණ්ඩ නිර්මාණය කිරීමේදී පදම් කර ගන්නා ලද මැටි භාවිතා කිරීම මගින් උසස් ප්‍රමිතියෙන් යුත් භාණ්ඩයක් නිර්මාණය කර ගැනීමට ඇති හැකියාව සහ පිළිස්සීමේදී ඇති විය හැකි දෝෂ මගහරවා ගැනීම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම මැන බැලීම මින් අපේක්ෂා කෙරේ.**

| |
|---|
| **6.** අතීතයේ සිට වර්තමානය දක්වා ම සෙරමික් කලාව විවිධ විපර්යාසයන්ට ලක්වෙමින් විකාශනය වී ඇත.<br>(i) තාක්ෂණික උපකරණ භාවිත කරමින් මැටි භාණ්ඩ සකස් කළ හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කරන්න.<br>(ii) ඔබ කැමති මැටි භාණ්ඩ නිර්මාණ ක්‍රම ශිල්පයක් භාවිතයෙන් මැටි භාණ්ඩයක් සකස් කර ගන්නා ආකාරය පියවර සහිතව විස්තර කරන්න.<br>(iii) නිෂ්පාදිත මැටි භාණ්ඩයක් පිළිස්සීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. |

(i) සකපෝරුවේ ඉදි කිරීම

වාත්තු ක්‍රමය

අච්චු ක්‍රමය

ශිල්පීය ක්‍රම 02 ක් නම් කිරීමට

(ලකුණු 02)

(ii) කැමති ක්‍රම ශිල්පයකට මැටි භාණ්ඩයක් සකස් කර ගන්නා අකාරයට විස්තර සහිතව ලියා දැක්වීමට

(ලකුණු 04)

(iii) පිළිස්සීමේ ඇති වැදගත්කම

- උෂ්ණත්වයට ඔරොත්තු දීම
- කල් පැවැත්ම
- ශක්තිමත් බව
- ඔප දමා ඇත්නම් දියර උරා නොගැනීම
- ඔප දමා ඇත්නම් දිලීර, බැක්ටීරියා වර්ධනය නොවීම.
- අම්ලවලට ප්‍රතික්‍රියා නොකිරීම

වැනි කරුණු ඇතුළත්ව කෙටි විස්රතයක් ලිවීමට

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

7. **මෙම ප්‍රශ්නය මගින් උද්‍යාන අලංකරණ ක්‍රියාවලියේ යොදා ගන්නා මාධ්‍ය,ක්‍රම ශිල්ප හා අලංකරණ ක්‍රියාවලිය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම,කුසලතා,ආකල්ප මැන බැලීම අපේක්ෂා කෙරේ.**

| |
|---|
| **7.** ගෘහ නිර්මාණ ශිල්පයේ දී ගෘහ අලංකරණය මෙන් ම උද්‍යාන අලංකරණ නිර්මාණ සඳහා ද විශේෂ වැදගත්කමක් හිමි වේ.<br>(i) උද්‍යාන අලංකරණ මූර්ති සඳහා භාවිත කළ හැකි මාධ්‍ය **හතරක්** සඳහන් කරන්න.<br>(ii) ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා විශාල මැටි බඳුනක් නිෂ්පාදන අවස්ථාවේ දී අලංකරණය කිරීමට යොදා ගත හැකි ක්‍රම ශිල්ප **දෙකක්** සඳහන් කර, ඉන් **එක්** ක්‍රම ශිල්පයක් විස්තර කරන්න.<br>(iii) උද්‍යානයක තැබීමට සුදුසු සත්ත්ව ආකෘතියක් යෝග්‍ය මාධ්‍යයක් භාවිතයෙන් නිර්මාණය කරන ආකාරය පියවර සහිතව පැහැදිලි කරන්න. |

(i) ගල්
ලෝහ
කිරිගරුඬ
දැව
සිමෙන්ති
ප්ලාස්ටර් ඔෆ් පැරිස්
පල්ප්

**මාධ්‍ය හතරක් නම් කිරීමට**
**(ලකුණු 02)**

(ii) කැටයම් කිරීම

සායම් සිරුම් රටා යෙදීම

ඔන්ගොබි කිරීම

මුද්‍රා මගින් තහඩු මෝස්තර යෙදීම

මැටි දරණු, පේකඩ යෙදීම

ගුරු ගල් අලේප කිරීම

**වැනි ක්‍රම ශිල්ප විස්තර කිරීමට**
**(ලකුණු 02)**

(iii) සත්ත්ව රූපයකට සුදුසු මොස්තරයක් ඇඳීමට **(ලකුණු 02)**

සකස් කර ගන්නා ආකාරය පියවර සහිතව විස්තර කිරීමට **(ලකුණු 02)**